
# Animated gif ඇසුරින් ඩිජිටල් තොරණක් හදමු




Animated gif ඇසුරින් තොරණක් නිර්මාණය කිරීම

ඉහත පිටුවට පිවිසෙන්න Make my own ක්ලික් කර AppLab වෙත පිවිසෙන්න.

සුපුරුදු පරිදි, Remix ක්ලික් කර Rename මගින් ව්‍යාපෘතියට ඔබට නම යොදන්න. මෙම නිර්මාණය සඳහා Screen 4 ක් අවශ්‍ය වේ. පළමු Screen එක සඳහා පහත පරිදි සකස් කරගෙන ඒ තුළ buttons තුනක් නිර්මාණය කරන්න.




පළමු startScreen එකෙහි Properties








button1 හි Properties





ඉහත button1 හි Properties අනුව නිසි පරිදි සකසාගත්button1 හි පිටපතක් Duplicate මගින් ලබාගෙනමින් button2 හා button3 සකස්කර ගන්න.

දැන් startScreen නම් පළමු screen එක සකසා අවසන්ය. එයට අදාල images ඇතුළත් කිරීමට පෙර එම screen එක Duplicate මගින් පිටපත් කර තවත් screen 3- ක් ලබාගන්න.


එවිට අදාල buttons තුනත් බෙදී ඇති screen1, screen2 හා screen3 පහත පරිදි ලැබේ.





දැන් එක් එක් screen තුළට අදාල කල යුතු images හා animated gif තෝරාගත යුතුය. මෙ සඳහා screen එකක් තුළට 

අයිකනයක් ගෙනගොස් තබා ඊට අදාල රූපය තෝරා ගැනීමට 

"Choose" මගින් **Choose Assets** වෙත පිවිසෙන්න. එහි ඇති රූප හඳුනා ගනිමු.




දැන් එක් එක් screen තුළ images හා animated gif සුදුසු පිහිටීම හා විශාලත්වය ගැලපෙන අයුරින් කල යුතුය. ඒ සඳහා එක් එක් රූපවලට අදාල id යොදාගෙන Properties අනුවට බලගන්න.






අවශ්‍ය පරිදි රූප මතුපිටට (ඉදිරියට) ගැනීමට හෝ පසුපසට යැවීමට පහත බොත්තම් භාවිතා කරන්න.




පහත රූපවල පරිදි එක් එක් screen තුළ images හා animated gif සුදුසු පිහිටීම් හා විශාලත්වයෙන් ගලපමින් අවසන් කරන්න.






## දැන් කෝඩ්ස් සැකසීම සඳහා බලමු

1. මුලින්ම තොරණේ පසුබිම් වාදනයක් ලෙස ගීතයක් ඇතුළත් කරන්න.

```
playSound("Paramitha-bala.mp3", true);
```

2. සෑම screen එකකම ඇති බුදුවීම button එක click කල විට screen1 වෙත යාමට කෝඩ් සකසන්න.

```
onEvent("button2", "click", function( ) {
  setScreen("screen1");
});
```

3. සෑම screen එකකම ඇති ඉපදීම button එක click කල විට screen1 වෙත යාමට කෝඩ් සකසන්න.

```
onEvent("button1", "click", function( ) {
  setScreen("screen2");
});
```

4. සෑම screen එකකම ඇති පිරිණිවන button එක click කල විට screen1 වෙත යාමට කෝඩ් සකසන්න.

```
onEvent("button3", "click", function( ) {
  setScreen("screen3");
});
```

ඔබ නිර්මාණය කළ ඇප් එකෙහි පසු ඔබේ නම, පාසල වැනි තොරතුරු ඇතුළත් කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා Label tool එක භාවිතා කළ හැකිය.




**වෙනත් ජාතක කතාවකට අදාල පින්තූර සොයාගෙන ඔබට අවශ්‍ය පරිදි screen ප්‍රමාණය වැඩි කරමින් ඔබගේ සිත්ගත් ඩිජිටල් තොරණ ඇප් එක තව දුරටත් නිර්මාණය කළ හැකිය.**

ජාතක කතාවකට අදාල පින්තූර සොයාගැනීමට **කෘතිම බුද්ධියෙන් පින්තූර නිර්මාණය කරන AI Image Creator යෙදුමක් භාවිතා කළ හැකිය**.

Microsoft Bing Image Creator භාවිතයෙන් නලපාන ජාතකයේ පෙන්වන අන්දමට සිදු වූ පොකුණ අසල සිටින වඳුරන් සමූහයකගේ පින්තූරයක් ඉල්ලීමක් ලෙස ලබා දී නිර්මාණය කරගත හැක. **මෙහිදී අපගේ අවශ්‍යතාවය තවදුරටත් පැහැදිලිව ඉදිරිපත් කළේ නම් වඩාත් යෝග්‍ය පින්තූර Ai Image Creator මගින් ලබාදෙනු ඇත.**

